# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022**
**2025 ජූලි**

**සමාජීය විද්‍යා පීඨය**

## දේශපාලන විද්‍යාව
**(නව නිර්දේශය)**

## ජාත්‍යන්තර දේශපාලනය POLS 38214

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ජාත්‍යන්තර දේශපාලනය යනු කුමක්ද? සහ එය අභ්‍යන්තර (ජාතික) දේශපාලනයට වඩා වෙනස් වන්නේ කෙසේද? පැහැදිලි කරන්න.

02. යථාර්ථවාදී ප්‍රවේශය ජාත්‍යන්තර දේශපාලනයේ බල ගතිකත්වය සහ ගැටුම් පැහැදිලි කරන ආකාරය විමර්ශනය කරන්න.

03. සීතල යුධ සමයේ එක්සත් ජනපදය සහ සෝවියට් සංගමය අතර පැවති දෘෂ්ටිවාදාත්මක එදිරිවාදිකම් ජාත්‍යන්තර දේශපාලනයට බලපෑවේ කෙසේදැයි ඇගයීමක යෙදෙන්න.

04. ජාත්‍යන්තර දේශපාලනයේ දී ''ජාතික බලය'' භාවිතය හැඩගැස්වීමේ දී ''ජාතික අභිලාෂ'' පිළිබඳ සංකල්පය ඉටු කරන කාර්යභාරය කුමක්ද? විග්‍රහ කරන්න.

05. ජාත්‍යන්තර ගැටුම්වලදී මැදිහත්කරුවෙකුගේ ප්‍රධාන භූමිකා සහ වගකීම් මොනවාද? සාකච්ඡා කරන්න.

06. ''ස්වෛරීභාවය පිළිබඳ මූලධර්මය ජාත්‍යන්තර මැදිහත්කරණය සමඟ ගැටේ.'' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

07. කෘත්‍රිම බුද්ධිය, ඩ්‍රෝන යානා සහ සයිබර් යුද්ධවල නැගීම ගෝලීය වශයෙන් හමුදා උපාය මාර්ග (යුද්ධ) වෙනස්කර ඇති ආකාරය විමසන්න.

08. චීනය, ඉන්දියාව සහ අනිකුත් නැගී එන ආර්ථිකයන් හි වර්ධනයත් සමඟ ගෝලීය බලතුලනය වෙනස් වී ඇති ආකාරය නිදසුන් සහිතව විශ්ලේෂණය කරන්න.

******************************